**ඇමරිකන් පුරවැසි සේවා**

ශ්‍රී ලංකාවේ  කොළඹ  ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ඇමරිකන් පුරවැසි සේවා ඒකකය ඔබ සාදරයෙන් පිළිගනී. ශ්‍රී ලංකාවට හා මාලදිවයිනට පැමිණෙන හා ජීවත් වන එක්සත් ජනපද  පුරවැසියන් සඳහා මෙම (ACS) ඒකකය සේවා සපයයි.

ඇමරිකන් පුරවැසි සේවා ඒකකය ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ සිටින ඇමරිකන් ජාතිකයන්ට ගමන් බලපත්‍ර හා උපත් හා මරණ සහතික නිකුත් කිරීම මෙන් ම නොතාරිස් ලේඛන සේවා ද සපයයි. අත්අඩංගුවට පත්වීම හෝ අනාථ වීම වැනි විපත්වලට පාත්‍රවූ එක්සත් ජනපද පුරවැසියන්ට මෙම ඒකකය සහාය වේ. මෙම ඒකකය විසින් නිර්දේශිත වෛද්‍යවරුන්ගේ, දන්ත වෛද්‍යවරුන්ගේ හා නීතිඥයින්ගේ ලැයිස්තුවක් පවත්වා ගෙන යනු ලැබේ.

තානාපති කාර්යාලය පිහිටා ඇත්තේ කොළඹ 3 ගාලු පාරේ අංක 210 දරණ ස්ථානයේයි. සඳුදා හා බදාදා සවස් වරුවේ වේලාවක් වෙන් කරවා ගැනීමෙන් අනතුරුව ඇමරිකන් පුරවැසි සේවා අංශයෙන් සාමාන්‍ය සේවා ලබා ගත හැකි වේ.  අපේ සබැඳි පද්ධතියට  පිවිස වේලාවක් වෙන් කර ගන්න.

https://evisaforms.state.gov/acs/default.asp?postcode=CLM&appcode=1